
## 2.6 සංඛ්‍යා පාද කට්ටලය



හැඳින්වීම :-

දරුවන්ට ගණිත විෂය ඉගැන්වීමේ දී විවිධ සංඛ්‍යා පාද ඔස්සේ සංඛ්‍යා ඉගෙනීමට සිදුවේ. ඒ සඳහා සැකසූ ක්‍රියාකාරී උපකරණයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙහි දෙකේ සංඛ්‍යා පාද කට්ටලයේ සිට දහය දක්වා සංඛ්‍යා පාද කට්ටල 9ක් අඩංගුව ඇත.

අඩංගු දෑ :-


i. දෙකේ සංඛ්‍යා පාද කට්ටලය
ii. තුනේ සංඛ්‍යා පාද කට්ටලය
iii. හතරේ සංඛ්‍යා පාද කට්ටලය
iv. පහේ සංඛ්‍යා පාද කට්ටලය
v. හයේ සංඛ්‍යා පාද කට්ටලය
vi. හතේ සංඛ්‍යා පාද කට්ටලය
vii. අටේ සංඛ්‍යා පාද කට්ටලය
viii. නවයේ සංඛ්‍යා පාද කට්ටලය
ix. දහයේ සංඛ්‍යා පාද කට්ටලය
x. සනක 50ක් අඩංගු පැකැට්ටුව

භාවිතා කළ හැකි අවස්ථා :-


| ශ්‍රේණිය | පාඩම | භාවිත කළ හැකි අවස්ථා |
|---|---|---|
| 10 | සංඛ්‍යා පාද | 1. 10 පාදයේ සංඛ්‍යා වෙනත් පාදයක (2,3,4,5,6,7,8,9)සංඛ්‍යාවක් ලෙස පරිවර්තනය කරයි.<br>2. එකම පාදයේ සංඛ්‍යා දෙකක් එකතු කරයි. |

ගුරු උපදෙස් :-

දෙකේ සංඛ්‍යා පාද කට්ටලය




මෙහි කූරකට දැමිය හැකි උපරිම සනක සංඛ්‍යාව 01කි. සෑම කූරකටම ගණක යෙදූ විට පහත පරිදි දැක්වේ.





මෙම සංඛ්‍යාව සටහන් කරනුයේ පහත සඳහන් පරිදිය

$1111_{\text{දෙක}}$

මෙය දහයේ පාදයට හැරවූ විට අගය මෙසේය.

16 + 8 + 4 + 2+ 1 = 31


පහත දැක්වෙන්නේ දෙකේ  පාදයෙන් පෙන්වා ඇති තවත් සංඛ්‍යාවකි.




එය $10101_{\text{දෙක}}$ වේ.

එය දහයේ පාදයට 16 + 0 + 4 + 0 +  1 = 2


හතරේ සංඛ්‍යා පාද කට්ටලය




මෙහි සංඛ්‍යාව සටහන් කරනුයේ මෙසේය.

$11213_{\text{හතර}}$

මෙය දහයෙ පාදයේ සංඛ්‍යාවකට හරවා බලමු.




සිසු උපදෙස් :-

කාර්ය පත්‍රිකාව

a. දහයේ පාදයේ සංඛ්‍යා සනක රාමුව තෝරා ගන්න.
   i. එකේ ඒවා දැක්වෙන කූර පමණක් යොදා ගෙන නිරූපණය කළ හැකි සංඛ්‍යා පිළිවෙළින් ලියා තබන්න.
   ii. 10 පාදයේ සනක රාමුවක එක් සනකයක්වත් යොදා නොගෙන නිරූපණය කළ හැකි සංඛ්‍යාව ලියන්න.
   iii. 10පාදයේ සනක රාමුවෙන් එක් සනකයක් පමණක් යොදා ගෙන නිරූපණය කළ හැකි සංඛ්‍යා නිරූපණය කරමින් සොයාගන්න. එම සංඛ්‍යා ලියන්න.


b. 10 පාදයේ සනක රාමුවත් 9 පාදයේ සනක රාමුවත් වගුවේ දැක්වෙන සංඛ්‍යා නිරූපණය කරමින් හිසුතැන් පුරවන්න.

| 10 පාදයේ සංඛ්‍යාව | 9 පාදයේ සංඛ්‍යාව |
|---|---|
| 1 | ........ |
| ...... | 2 |
| 3 | ........ |
| ...... | 5 |
| 8 | ........ |
| 9 | ........ |
| ....... | 11 |
| ....... | 12 |
| 12 | ........ |
| ....... | 14 |
| 14 | ........ |
| ....... | 18 |
| 18 | ......... |
| ....... | 21 |
| 20 | ......... |

c. 4 පාදයේ සනක රාමුව ගෙන එය දෙස බලා පහත වගුව පුරවන්න.

| බලය | අගය |
|---|---|
| $4^0$ | |
| $4^1$ | |
| $4^2$ | |
| $4^3$ | |
| $4^4$ | |

4 පාදයේ සනක රාමුවක් නිරූපණය කර ඇති සංඛ්‍යාව 10 පාදයේ ලියා ඇති සැටි අධ්‍යනය කරන්න.




$1 \times 4^0 + 2 \times 4^1 + 0 \times 4^2 + 3 \times 4^3 + 2 \times 4^4$

$= 1 \times 1 + 2 \times 4 + 0 \times 16 + 3 \times 64 + 2 \times 256$

$= 1 + 8 + 0 + 192 + 512$

$= 713$

ඔබ කැමැති සංඛ්‍යාවන් 4 පාදයෙන් සනක රාමුවෙන් නිරූපණය කර 10 පාදයක සනක රාමුවකින් නිරූපණය කරන්න. එම සනක රාමු දෙකම ඇද පෙන්වන්න.

පහත වගුව සනක රාමු උදව් කර ගනිමින් පුරවන්න.

| පාදය | 10 පාදයේ සංඛ්‍යාව | 9 පාදයේ සංඛ්‍යාව | 8 පාදයේ සංඛ්‍යාව | 7 පාදයේ සංඛ්‍යාව | 6 පාදයේ සංඛ්‍යාව | 5 පාදයේ සංඛ්‍යාව | 4 පාදයේ සංඛ්‍යාව | 3 පාදයේ සංඛ්‍යාව | 2 පාදයේ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංඛ්‍යා | 1<br>2<br>3<br>4<br>5<br>6<br>7<br>8<br>9<br>10 | | | | | | | | |
| භාවිතය ට ගත් ඉලක්කම් | | | | | | | | | |